**කෑගල්ල ප්‍රාදේශීය සභාව - 2020**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

කෑගල්ල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය,වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක
  සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලනකල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(i)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොරොන්තොට පොදු වෙළඳ සංකීර්ණයේ පළමු මහල ඉදිකිරීම් කර්මාන්තයේ පරිපාලන හා උපදේශන වියදම රු. 337,972 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා ණයහිමියෝ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | සත්‍ය වියදම රු.990,556 ක් වූ අතර, වැඩියෙන් තක්සේරු වූ මුදල 2021 වර්ෂයේ සමුච්චිත අරමුදලට කපා හැරි බවත් ඉදිරියේදී සැලකිලිමත් ලෙස කටයුතු කරන ලෙස විෂය නිලධාරින් දැනුවත් කළ බවත් දන්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙලකළ යුතුයි. |
| (ආ) | ඉකුත් වර්ෂයට අදාල රු. 18,446 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගතකර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | වවුචර් පත් 6ක අතිකාල දීමනා වලට ඔවුන් විසින් ප්‍රතිපාදන වෙන් කිරීමට ඉල්ලීම් කර නොමැති වීමෙන් ණය හිමි ප්‍රතිපාදන වලින් ගලපා ගැනීමට කටයුතු කර ඇති බවත් ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීම සිදුකළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,293,998 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,121,179 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | හිඟ වරිපනම් හා බදු ශේෂය රු. 1,152,759ක් වූ අතර මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවතින කොරෝනා වසංගත තත්වය මත වරිපනම් බදු එකතු කිරිම සඳහා ක්ෂේත්‍රයේ යාමට නොහැකි අතර, ඉදිරියේදී ජංගම සේවා කටයුතු කර හිඟ මුදල් ප්‍රමාණය අවම කරගන්නා බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතුකර හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු. 220,741 ක් විය. | පවතින හිඟයෙන් කොටසක් නාගරික වසම්වල ඉඩම් බෙදී යාම තුල බදු අයකරගත නොහැකි තත්වයේ දේපල වන අතර එම දේපල හඳුනා ගැනීම සඳහා සතොයක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. ඉදිරියේදී මෙම කටයුතු නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ ශේෂය රු. 14,360,502 ක් සහ මුද්දර ගාස්තු ශේෂය රු.28,130,490ක් විය. | හිඟ හිටි උසාවි දඩ මුදල් ප්‍රධාන අමාත්‍යාංශයට ලබා දී ඇති නමුත් මේ දක්වා සභාව වෙත ලබාදී නොමැති බැවින් නැවත වරක් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බවත්, දන්වා තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රංවල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී පොදු අරමුදලින් රු.983,000ක් ණයහිමියන් ලෙස වෙන්කිරීම් කර තිබුණද විගණන දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර හෝ ඒ සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. | මේ වන විට ණය හිමියන් තුල වෙන්කර ඇති මුදලින් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සහ සැලැස්ම සකස් කිරීම සඳහා වූ මුලික වියදම් දැරීමට නියමිත බවත් දන්වා තිබුණි. | ඉදිකිරීම් කටයුතු හැකි ඉක්මනින් සිදු කිරීමට කටයුතුකල යුතුයි. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශයට අයත් රු.35,474,734 ක් වටිනා වාහන 5 ක්, සබරගමුව පළාත් සභාවට අයත් රු.3,865,000 ක් වටිනා ට්‍රැක්ටර් 2ක් හා රු.416,000 ක් වටිනා ටෙලර් 2ක් සභාවේ කටයුතු සඳහා යොදවාගෙන තිබූ නමුත් 2017 දෙසැම්බර් 21 දිනැති අංක 20/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන සියල්ල සභාව නමට පවරා ගැනීමට අවශ්‍ය සියලු ලියකියවිලි සකස් කර අවසන්ව ඇති බවත් කඩිනමින් ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ එකතු වූ නොදිරන කසල ප්‍රමාණය ටොන් 5ක් පමණ විය. ඒ සඳහා දරා ඇති වියදම රු.164,000ක් පමණ වන අතර යොදවා ඇති සේවකයින් ගණන 03කි. කසල කළමනාකරණ කටයුතු සඳහා ඉඩමක් නොමැතිවීම හේතුවෙන් නොදිරන කසල විකුණනු ලබන අතර දිරන ද්‍රව්‍ය මොරොන්තොට පොල භූමියට මුදාහැර තිබුණි. | ඉදිරියේදී ඉවත් කරන කසළ උපයෝගී කර ගෙන ජීව වායු ඒකකයක් සතිපොළ භූමියේ ස්ථාපිත කර විදුලිය ලබා දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් සකස් කර ඇති බව දන්වා තිබුණි. | කසල කළමනාකරණ කටයුතු විධිමත් කර ගත යුතුයි. |